# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2321/04 - 2023 පෙබරවාරි මස 27 වැනි සඳුදා - 2023.02.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත**

2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 117 (2) උපවගන්තිය යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**නිමල් සිරිපාල ද සිල්වා,**
වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍ය.

2023 පෙබරවාරි මස 23 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

අවසන් වරට 2023 පෙබරවාරි 07 දිනැති අංක 2318/14 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝගයෙන් සංශෝධිත, 2022 ඔක්තෝබර් 26 දිනැති අංක 2303/18 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2022 සිවිල් ගුවන් සේවා (ගගන යාත්‍රාංගන පරිහරණය කිරීම වෙනුවෙන් අය කරනු ලබන ගාස්තු) නියෝග පහත ආකාරයෙන් සංශෝධනය කරනු ලැබේ.

(1). එහි 2 වන නියෝගයෙ හි -
(අ) එහි 2(5) උප නියෝගයට ඉනික්බිතිව ම පහත දැක්වෙන අලුත් උප නියෝගය ඇතුළත් කිරීමෙන් :-

''2(6) මෙම නියෝගවලට පටහැනිව කුමක් සඳහන් වුවද, කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපල රත්මලාන (කො.ජා.ගු.ර.) වෙත මෙහෙයුම් ක්‍රියාත්මක කරනු ලබන, යම් උපලේඛනගත ජාත්‍යන්තර ගුවන් සමාගමක් 2023.03.01 වන දින සිට ක්‍රියාත්මක වන මාස හයක (06) කාල සීමාවක් සඳහා මෙහි 2(1) (අ) ඡේදයේ සඳහන් කර ඇති ගොඩබැසීම් සහ නැවතුම් ගාස්තු ගෙවීම් වලින් නිදහස් කරනු ලැබිය යුතුය.''

EOG 02 - 0325

1A - PG 6238 — 356 (2023/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*